සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சப்ரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024
අවසාන වාර පරීක්ෂණය

සිංහල භාෂාව හා සාහිත්‍යය I
வரலாறு I
Sinhala I

71 S I

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

පැය තුනයි
03 மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

- පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) උද්ධෘත අතුරෙන් සතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදා ගන්න)

(අ) සිටුදුවණියෝත් තුන්විටක් පැදකුණු කොටලා සතර තැනෙක සිට වැදලා 'ස්වාමීනි' මේ කෙළවර දැක්ම ය. මෙවත් පටන් නුඹවහන්සේගේ මා දැක්මකුත් මාගේ නුඹවහන්සේ දැක්මකුත් නැතැ'යි කියාලා ඉදිරි දිසාවේ සිටත් සිපගෙන පියා පිටි පස්සේ සිටත් සිපගෙන පියා කුමක් දෝ හෝ යි සිතමින් ගල් කෙළවර පමාව සිටියනු තුඹු පිටිපස්වලා එක් අතෙකින් බොටුව අල්වාගෙන එක් අතෙකින් පිටිමුල අල්වාගෙන ඌගේ කායබල තරමට තමන්ගේ ඥානාකෘති වූ මායාබලය මහත් හෙයින් ගල්මුදුනෙන් දැමුව. හෙතෙම කඩ කඩ ව ගලින් හී මිය තෙමේ ම බිලි විය. සොරපවුවේ වසන දෙවතාණෝ උන් දෙන්නාගේ ම කටයුත්ත දැක හැමතැන දී ම පිරිමින් උපදෙස් දනති නැත කිවුය. සමහර තැනක ගැණු ද උපදෙස් දනිති කිවු ය. සිටුදුවණියෝද සොරුන්ගේ අකුසල් නමැති සතුරාත් සහාය කොට ගෙන සොරු ගලින් හෙළලා තමන්ගේ කුසල් නමැති මිත්‍රයාණන් සහාය කොට ගෙන තුඹු ගැළවී ගෙන සිත ඉදින් මම ගෙට ගියෙම් නම් තොපගේ ගෙහිමියෝ කොයි විචාරති.

i. මේ දෙදෙනාගේ කටයුත්ත දුටු තෙවන තැනැත්තා කවුරුන්ද?

ii. සිටු දියණිය සොරා හට පැවසූයේ කුමක් ද?

iii. "ඌගේ කායබල තරමට තමන්ගේ ඥානාකෘති වූ මායාබලය මහත් හෙයින් " මෙය ලිහිල් බසින් ලියන්න.

iv. 'පැදකුණු' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 4යි)

(ආ) එවේලෙහි මැණියෝ කම්පිත වූ සිත් ඇතිව ළපිරුණු ශෝකයෙන් අනිකක් කියාගත නොහී මායමින් දරුවන් තපසට යා නො දෙමියි සිතා එකලට භද්දිය රජ්ජුරුවන් රාජ්‍යය කරන කාලය හෙයින් "පුත ! තොපගේ කල්‍යාණ මිත්‍ර වූ එක කෙළි මඩලෙහි වැඩිවා වූ ඒක ප්‍රාණී වූ භද්දිය නම් රජ්ජුරුවන්ට කියාලා ඔහු මහණ වෙත් නම් උන් හා සමග ගොස් බුදුන් කෙරෙහි මහණ



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
2024.10.23 15:54

වච"යි කීහ. ඒ වේලෙහි අනුරුද්ධ කුමාරයෝ "යහපත මෑණියෙනි ! උන් යනෙන් යන්නෙම් වේදැ"යි කීහ. හිසොබූ "රජෙක් නම් රාජශ්‍රී හැර කවර කලෙක නම් මහණ වේ දැ"යි සිතා "යහපත, යව පුතණුවෙනි ! "යි කීහ.

එවේලෙහි අනුරුද්ධ කුමාරයෝ රජගෙට නික්ම මග දී සිතන්නාහු "මාගේ මෑණියන් වහන්සේ රජ්ජුරුවෝ නම් මහණ වන්නට නොයෙති. උන් කරා යවු කළ මනු නුත් රැඳවා ගනිමි"යි මායමින් සමුදුන් සේක. රජ්ජුරුවන් මහණ නොවන්නෝත් හැබැව. මම උපදෙසකින් උනුත් එක්කොට ගෙන මහණ වෙම්මය" යි සිතා අපගේ ශාක්‍ය කුලයෙහි රජ්දරුවෝ නම් දිවියේ නමුත් බොරු නොකියති. උපදෙසකින් මහණ වෙමි යි කියවා ගෙන ඒ බස මුල් කොට රජහට චෝදනා කොට ලජ්ජා කරවා මහණ වන සේ ගිවිස්වා ගනිමි යි සිතාලා...

i . අනුරුද්ධ කුමාරයාගේ කල්‍යාණ මිත්‍රයා කවරෙක් ද?

ii. මව අනුරුද්ධ කුමරු, භද්දිය රජුවෙත යොමුකර වූයේ කවර අරමුණකින් ද?

iii. "කල්‍යාණ මිත්‍ර වූ එක කෙළි මඬලෙහි වැඩිවාවූ ඒක ප්‍රාණි වූ" මෙය ලිඛිල් බසින් ලියන්න.

iv. "රාජ්‍ය ශ්‍රී" යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 4යි)

(ඉ) එදවසට බිසවුන් ප්‍රධාන කොට සතළිස් දහසක් නාටකඞගනාවෝ වෙසෙති. ඒ සතළිස් දහසක් නාටක ස්ත්‍රීන් කෙරෙන් හුදු උභය පරිශුද්ධ ක්ෂත්‍රිය කන්‍යාවෝ ම එක් දහස් අනූවක් දෙනය. බිම්බා දේවී ද බුදුන් තමන්ගේ භවනයට වඩනා නියාව අසා ඒ ක්ෂත්‍රිය කන්‍යාවන් හැම දෙන ම කසාය වස්ත්‍ර ගෙන හැද පෙරව අව මැනව යි විධාන කළහ. උයිත් එලෙස ම අවුත් පිරිවරා සිටියාහ. බුදුහු වැඩ වදාරා පනවන ලද ආසන මස්තකයෙහි පලක් බැඳ වැඩ උන් සේක. ඉක්බිති හැමදෙන ම එක පැහැර බුදුන් පාමුල්හි අඬා හුන්හ. බිම්බා දේවින් වහන්සේ ද බුදුන්ගේ ශ්‍රී පාදයෙහි ජංඝා පරියන්තය තරයේ අල්වා හඬා වැලප සෝක සන්හිඳුවා මයිල් රජ්ජුරුවන් වහන්සේ කෙරෙහි මහත් වූ ආදර බහුමානයෙන් එකත් පසෙක උන් සේක.

i . බිසවුන් ප්‍රධාන කොට සිටි නාටකඞගනාවන් ගණන කොපමණ ද?

ii. බිම්බා දේවිය ක්ෂත්‍රිය කන්‍යාවන් හට කළ විධානය කුමක් ද?

iii. බුදුන්ගේ ශ්‍රී පාදයෙහි ජංඝා පරියන්තය තරයේ අල්වා හඬා වැලප" මෙය ලිඛිල් බසින් ලියන්න.

iv. "එකත් පසෙක" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 4යි)

(ඊ) ඒ චන්ඩප්‍රද්‍යෝත රජ්ජුරුවන්ගේ අනර්ඝ වූ දිව්‍යසමාන වූ වාහන පසෙක් ඇත. කෙසේ වූ වාහන පසෙක් ද යත්? භද්‍රවතී නම් ඇතින්නක් දවසක් ඇතුළත පනස් යොදුන් ගොස් පනස් යොදුන් එන පමණ ගමන් ඇත්තී ය. දෙවියන් විසින් මැවූ ඔපපාතික වූ කාක නම් දවායෙක් දවස සැට යොදනක් ගොස් සැට යොදනක් එයි. නාලාගිරි නම් ඇතෙක් සියක් යොදුන් ගොස් සියක් යොදුන් එයි. මුඤ්ජකේශි නම් වෙළඹක හා තේලකර්ණ නම් අශ්වයකු හා දෙදෙන එක්සිය විසි යොදුන් ගොස් එක්සිය විසි යොදුන් එන්නාහ. මුළු දඹදිව මෙසේ වූ පඤ්ච මහා වාහන ඇති එන රජෙකුත් නැත. ඒ කෙසේ වූ පින් බලයෙකින් ලද්දාහු ද යත්? ඒ රජ්ජුරුවෝ ගිය දවස දිළිඳු වූ කුලයෙක ඉපැද අනුන් විසින් දන්දෙන ලද බත්පාත්‍රයක් සමසිතින් තමන් කර



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
2024-10-23 15:54

තබා ගෙන එහ එහා දිවගොස් වේලා නොවරදවා පසේ බුදු කෙනෙකුන් වහන්සේට පිළිගන්වා තමන් අතින් දැවැටි පැන් පෙරාදී වළඳවා "ස්වාමීනි ! නුඹ උදෙසා අද මා විසින් කළ කාය වෛයාවෘත්‍යයෙහි අනුසසින් මතු මෙසේ වූ දුඃඛිතකුලයෙක නූපදිම්වයි රජකුලෙහි උපදිම්ව යි. මේ බත්පාත්‍ර ය ඉසිළූ පිනින් මතු මා උසුළන ශීඝ්‍ර වාහන ලබම්ව" යි ප්‍රාර්ථනා කළහ.

i. චණ්ඩප්‍රද්‍යෝත රජු සතු වාහන සංඛ්‍යාව කොපමණ ද?

ii. කාක නම් දවායා දිනකට යොදුන් කොපමණ දුරක් ගෙවන්නේද?

iii. මේ බත්පාත්‍රය ඉසිළූ පිනින් මතු මා උසුළන ශීඝ්‍ර වාහන ලබම්ව"යි යන්න ලිහිල් බසින් ලියන්න.

iv. "ඖපපාතික" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 4යි)

(උ) "දන කැන් නොයෙක් දෙස
කියනු කිම රැස් වූ ලෙස
පිරුණොත් ඒ බැරණැස
නොවී අවසර පවා පවුරිස

ජය වෙයි අද මොහුට
සිතමින දුටු දනහට
කර මුව පියුම තුට
පිවිස රජ උන් සොබා මඩුවට"

i. ජනයාගෙන් පිරී ගිය නගර අංගය කුමක් ද?

ii. මෙම ස්ථානයට ජනයා පැමිණ ඇත්තේ කොතැනක සිට ද??

iii. "කර මුව පියුම තුට" යන පද්‍ය පාදයේ අර්ථය ලියන්න.

iv. "නොවී අවසර" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 4යි)

(ඌ) සහ (එ) ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරකට අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "එසේ වී නම් පින්වන්ති තොප ඇම අප්‍රමාදව මෛත්‍රී භාවනාව කරව"

(ii) "මා දෙසූ බණ මදෙකැයි කියාත් බොහෝවකැ'යි කියාත් නොකියව"

(iii) "එසේ වූ දුකකට නුඹ යවාලා වැද හිඳීම මට බැරිය"

(iv) "උභයභෂ්ට්‍රව හිඳිනා තෙපි මට නින්දා කියා සිතාසෙන්නේ"

(v) "කී දෙනෙක් මැරිල ද? එකා ද? දෙන්න ද?"

(vi) "වනපොත් කරනට කව්නළු අනෙකා"

(vii) "ඒවා තමුසේ බලා ගන්නවා මට කියන්න එපා" (ලකුණු 03×4 = 12යි)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub
2024.10.23 15:55

(ඌ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි භාෂා භාවිතය හා කාව්‍ය ආකෘතිය කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයක් කරන්න.

**තවමත් ඔබ මගේය**

සිහිලැල් සිතාවට උණු කඳුළු නැවුණා
කඳුළෙහි සියුම් දහමෙක රසය ගැවුණා
උස් කඳු මුදුන් ගත මීදුමක පා වුණා
අරුණාලෝකයක් ඇඳිරියට යා වුණා

කළු ගල් පවා වන මල් පෙති මෙන් මුදු වේ
දවසෙක එහෙත් මල් පෙති කළු ගල් බඳු වේ
ලුහුබැඳ ගමන් ගත් අදහස් ඈත පොදුවේ
සිතූ දෙය නොසිදු වේ නොසිතුව දෙය සිදු වේ

හෙල් තැනිතලාවල උඳුවප් දුරුතු මහේ
ලස්සන දැකුමකුලු දේ අද බැලිය නොහේ
හිරිමල් හලන්නට ගඟ බඩ ඇටඹ ගහේ
මින් පසු නො ඒවා සීතල සුළඟ මෙහේ

උස් කඳු මුදුන්වල වැජඹෙන සිරිමලිය
ඔබගෙන් අලුත් දහමක් මට පැහැදිලිය
රුමත් මුහුණකට ඇති මිහිරි ම එළිය
සිහිලැල් සිතා රැළි නොව උණු කඳුළැලිය

රහසක් අනුව ඔබ හදවත ඔබට නොකී
මා ගැන අඳුරු සෙවණැලි හැම තැන ම දකී
පිය සටහන් ඇතත් කඳු හෙල් අතර මැකී
ගී හඬ ඔබට වා මඬලින් ඇසිය හැකී

කඳු බෑවුමේ දිය වැල් ගල් කුළෙක හැපී
වෙන් වී ගලාගෙන ගොස් දෙකඩකට කැපී
නැවතත් එකතු වන මෙන් පෙණ බුබුළු පිපී
කවදා කොතනකදී හෝ මුණගැහෙමු අපී

දේදුනු-වලාකුළු කඳුගැට දකින තුරු
බොල් පිනි පොකුරු - හිරිකඩ වැසි වැටෙන තුරු
මීදුම ගලන තුරු, වන මල් පිපෙන තුරු
ඔබ අමතක නො වේ කළු ගඟ ගලන තුරු

මුළු ලොව කිසිවකුට කිසි දවසකදී මතු
රහසක් නොවේවා ! යට ගිය යුගයෙ තතු
ඔබගේ හේලි කිවි මැඳුරට දවල බිතු
තිබුණා වගේමයි වෙනසක් නොවිය යුතු

සැඟවුණු ගිනි පුපුර අළු යට තිවේ නම්
ඒ මත අලුත් සිසිලක් කිති කැවේ නම්
මේ දිවි ගමන කෙටි මගකට ගෙවේ නම්
හමු වනුවට අගෙයි, යළි හමු නොවේ නම්

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

2024.10.23 15:55

2. සද්ධර්මරත්නාවලි කතුහිමි හාස්‍ය හා උපහාස රස ඇසුරු කර, කථා රසවත් කළ අතර, චරිත කෙරෙහි සානුකම්පික දෘෂ්ටියක් හෙළීමට පෙළඹෙයි. නිර්දිෂ්ට කතා ඇසුරෙන් උදාහරණ දක්වමින් විමසන්න.

නැතහොත්

සංකීර්ණ අවස්ථාවලට මුහුණ දෙමින් සක්‍රිය ක්‍රියා කරන ආකාරය ජාතක කතාකරුවා නිරූපණය කරන්නේ කතා අවස්ථා හා සිද්ධි ඇසුරිනි. [illegible] විමසන්න.

(ලකුණු 15යි)

3. සද්ධර්මාලංකාරයේ කථා [illegible] සමාජ, සංස්කෘතික හා ආර්ථික තොරතුරු සමූහයක් හෙළි කරයි. නිර්දිෂ්ට කථා වස්තු දෙක ඇසුරින් විමසන්න.

නැතහොත්

"එකිනෙක පරස්පර මාර්ග ඔස්සේ ජීවන අභිප්‍රායන් සඵල කර ගැනීමට වෙර දරණ තරුණයය යථාරූපීව ගෙනහැරපෑමට පූජාවලි කතුවරයා උත්සුක වෙයි" _අනුරුද්ධ කුමාර චරිතය හා ජීවක වෛද්‍යවරයාගේ චරිතය ඇසුරින් උක්ත කියමන විභාග කරන්න.

(ලකුණු 15යි)

4. (අ) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය බවට කෝට්ටේ යුගය බවට පත්වීමට බලපෑ හේතු ප්‍රධාන අංශ තුනක්වත් ඇසුරින් පහදන්න. (ලකුණු 7යි)

(ආ) සෑම වැනුමක් තුළදීම කිසියම් නවතාවක් ඉදිරිපත් කිරීමට ගුත්තිල කවියා පෙළඹෙයි. අභිමත වැනුම් දෙකක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 8යි)

5. ස්වකිය ජීවන අභියෝගවලට අභියෝග කරමින් ජීවිතයට දිරියෙන් මුහුණ දෙන ගැමි කාන්තාවක ලෙස පුංචි මැණිකාගේ චරිතය නිරූපණයේදී කතුවරයා භාෂාව භාවිත කළ ආකාරය ප්‍රශස්තය විමසන්න. (ලකුණු 15යි)

6. මානව සම්බන්ධතාවන් සූක්ෂම ලෙස විවරණය කිරීමට නූතන කෙටිකතාකරුවෝ උත්සුක වූහ. නියමිත කෙටි කතා තුනක් ඇසුරින් විමසන්න. (ලකුණු 15යි)

7. සමකාලීන සමාජ යථාර්ථයේ සංකීර්ණත්වය, අත්දැකීමට උචිත සංකල්ප රූප මතුකරමින් ඉදිරිපත් කිරීමට නිදහස් කවියේ ද්විතීය තරංගයේ කවිහු සමත් වූහ. නියමිත පද්‍ය පන්ති තුනක් ඇසුරින් විමසන්න. (ලකුණු 15යි)

8. "චරිත අවස්ථා හා සිද්ධි විකාශනයට උචිත පරිදි කාව්‍යාත්මක බස් වහරක් භාවිත කිරීමට දැක්වූ කුසලතාව ප්‍රේමතෝ ජායතී සෝකෝ නාට්‍ය වඩා රසවත් කරයි." නිදසුන් දක්වමින් විමසන්න.

(ලකුණු 15යි)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub